ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>ශ්‍රී ලංකා රජයේ බලශක්ති අමාත්‍යතුමා ඉන්දියාවේ සංචාරයක නිරත වේ</u>

ශ්‍රී ලංකා රජයේ බලශක්ති අමාත්‍ය ඉංජිනේරු කුමාර ජයකොඩි මහතා ඉන්දීය කර්මාන්ත සම්මේලනය (CII) නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නව, නැගීඑන සහ ක්‍රමෝපායික තාක්ෂණයන් පිළිබඳ අංශය සමඟ සහයෝගයෙන් නව දිල්ලියේ සංවිධානය කරන ලද හය වන ජාත්‍යන්තර බලශක්ති සමුළුව සහ ප්‍රදර්ශනය (IECE) සඳහා සහභාගී වීම සඳහා 2025 සැප්තැම්බර් 23-24 දිනවල ඉන්දියාවේ සංචාරයක නිරත විය. "ඉන්දියාවේ බලශක්ති පරිවර්තනය බලගන්වමින් කාබන් විමෝචනය ශුද්ධ ශුන්‍යයක් කිරීමේ ගමන් මඟ" යන්න සමුළුවේ තේමාව විය.

2. අමාත්‍යතුමා 'පැය 24 පුරා විදුලිය ලබා දීම සඳහා සූර්ය සහ සුළං බලශක්තිය ඉහළ නැංවීම' යන තේමාවෙන් යුත් සැසියක් ඇමතු අතර ඉන්දියාවේ නවීන තාක්ෂණය සහ නව සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ මනා පිළිවතේ ප්‍රදර්ශනය කර තිබූ IECE ප්‍රදර්ශනයට ද සහභාගී විය. අමාත්‍යතුමා සමුළුවට සමගාමීව ඉන්දියාවේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ සමාගම්වල ප්‍රධාන අන්දැකීම් නිලධාරීන් (CXO) සමඟ පැවති වටමේස සාකච්ඡාවකට ද සහභාගී විය. එසේම, එතුමා ජාතික තාපබල සංස්ථාවේ (NTPC) ප්‍රධාන කළමනාකාර අධ්‍යක්ෂතුමා ද හමු විය.

3. සංචාරය අතරතුරදී අමාත්‍ය කුමාර ජයකොඩි මහතා විදුලිබල, නිවාස සහ නාගරික කටයුතු අමාත්‍ය ශ්‍රී මනෝහර් ලාල් බට්ටර් මහතා සහ නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ශ්‍රී ප්‍රල්හාද් ජෝෂි මහතා ද හමු විය. මෙහිදී, බලශක්ති පද්ධති අන්තර් සම්බන්ධතාවය වැනි ද්විපාර්ශ්වික ව්‍යාපෘතීන් සහ ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට බලශක්තිය අපනයනය කිරීමට පවතින හැකියාව මෙන්ම නව සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ සහයෝගීතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

4. සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාවේ බලශක්ති අමාත්‍යතුමා ISO සහතික ලත් අති නවීන ගිගා වොට් 1.2ක සූර්ය බල මොඩියුල නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් වෙත ද සංචාරය කළේය.

****

**කොළඹ**
***2025 ඔක්තෝබර් 01***